# මජ්ඣේධ සූත්‍රය

මා හට අසන්නට ලැබුනේ මේ විදියට යි. ඒ දවස්වල භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ බරණැස් නුවර ඉසිපතන නම් වූ මිගදායේ. එදා ථේර ස්වාමීන් වහන්සේලා (පැවිදි උපසම්පදා වී බොහෝ වස් ගණනක් ගත වූ ස්වාමීන් වහන්සේලා) බොහෝ පිරිසක් දානය වැළඳීමෙන් පසු ව, මණ්ඩලමාලයේ (හිඳ ගැනීම පිණිස රවුම් හැඩයට සකස් කළ විවේක ස්ථානයක්) රැස් වී හිඳගෙන සිටින අතරතුර දී ඒ පින්වත් ස්වාමීන් වහන්සේලා අතර මේ කථාබහ ඇති වුනා.

"ඇවැත්නි භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ පාරායන වර්ගයේ මෙත්තෙය්‍ය ප්‍රශ්නයේ දී මෙන්න මේ විදියට දේශනා කරල තිබෙනවා."

**සෝ උභන්තමභිඤ්ඤාය[1] - මජ්ඣේ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහාපුරිසෝති - සෝ'ධ සිබ්බනිමච්චගා**

*"ඔහු විශිෂ්ට ඥානයෙන් අන්ත දෙක දැනගෙන ප්‍රඥාවෙන් මැද නො ඇලෙයි. ඔහු මහා පුරුෂයා යැ යි කියමි. ඔහු මැහුම (ගෙත්තම) ඉක්මවා ගියේ ය."*

ඇවැත්නි, මෙහි පළවෙනි අන්තය මොකක් ද? දෙවැනි අන්තය මොකක් ද? මැද කියන්නේ මොකක් ද? මැහුම කියන්නේ මොකක් ද?

මේ විදියට ප්‍රකාශ කළා ම එක්තරා ස්වාමීන් වහන්සේ නමක්, ථේර ස්වාමීන් වහන්සේලාට මෙහෙම කිව්වා.

01. "ඇවැත්නි, ස්පර්ශය එක් අන්තයක්. ස්පර්ශයේ හට ගැනීම දෙවැනි අන්තය යි. ස්පර්ශ නිරෝධය මැද යි. තණ්හාව තමයි මැහුම. ඒ ඒ භවයේ උපත ලැබීම පිණිස තණ්හාව සත්වයා ව ගෙත්තම් කරනවා (මහනවා).

ඇවැත්නි, මෙපමණකින් භික්ෂුව විශේෂ ඥාණයෙන් අවබෝධ කරගත යුතු දේ විශේෂ ඥාණයෙන් අවබෝධ කරගන්නවා. පිරිසිඳ දැන ගත යුතු දේ (තණ්හාව ප්‍රහාණය වන ආකාරයට දැන ගත යුතු දේ) පිරිසිඳ දැන ගන්නවා. ඒ විදියට අවබෝධ කරගත යුතු දේ අවබෝධ කරගන්නා, පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැනගන්නා ඒ භික්ෂුව මේ ජීවිතයේ දී ම දුක කෙළවර කරන්නෙක් වෙනවා."

02. මේ විදියට කියපුවාම, තවත් ස්වාමීන් වහන්සේ නමක් ථේර ස්වාමීන් වහන්සේලාට මෙහෙම කිව්වා.

"ඇවැත්නි, අතීතය එක් අන්තයක්. අනාගතය දෙවැනි අන්තය යි. වර්ථමානය මැද යි. තණ්හාව තමයි මැහුම. ඒ ඒ භවයේ උපත ලැබීම පිණිස තණ්හාව සත්වයා ව ගෙත්තම් කරනවා (මසනවා).

ඇවැත්නි, මෙපමණකින් භික්ෂුව විශේෂ ඥාණයෙන් අවබෝධ කරගත යුතු දේ විශේෂ

ඤාණයෙන් අවබෝධ කරගන්නවා. පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැන ගන්නවා. ඒ විදියට අවබෝධ කරගත යුතු දේ අවබෝධ කරගන්නා, පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැනගන්නා ඒ භික්ෂුව මේ ජීවිතයේ දී ම දුක කෙළවර කරන්නෙක් වෙනවා."

03. මේ විදියට කියපුවාම, තවත් ස්වාමීන් වහන්සේ නමක් ථේර ස්වාමීන් වහන්සේලාට මෙහෙම කිව්වා.

"ඇවැත්නි, සැප වේදනාව එක් අන්තයක්. දුක් වේදනාව දෙවැනි අන්තය යි. සැපදුක් රහිත වේදනාව මැද යි. තණ්හාව තමයි මැහුම. ඒ ඒ භවයේ උපත ලැබීම පිණිස තණ්හාව සත්වයා ව ගෙත්තම් කරනවා (මසනවා).

ඇවැත්නි, මෙපමණකින් භික්ෂුව විශේෂ ඤාණයෙන් අවබෝධ කරගත යුතු දේ විශේෂ ඤාණයෙන් අවබෝධ කරගන්නවා. පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැන ගන්නවා. ඒ විදියට අවබෝධ කරගත යුතු දේ අවබෝධ කරගන්නා, පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැනගන්නා ඒ භික්ෂුව මේ ජීවිතයේ දී ම දුක කෙළවර කරන්නෙක් වෙනවා."

04. මේ විදියට කියපුවාම, තවත් ස්වාමීන් වහන්සේ නමක් ථේර ස්වාමීන් වහන්සේලාට මෙහෙම කිව්වා.

"ඇවැත්නි, නාමය එක් අන්තයක්. රූපය දෙවැනි අන්තය යි. විඤ්ඤාණය මැද යි. තණ්හාව තමයි මැහුම. ඒ ඒ භවයේ උපත ලැබීම පිණිස, තණ්හාව සත්වයා ව ගෙත්තම් කරනවා (මසනවා).

ඇවැත්නි, මෙපමණකින් භික්ෂුව විශේෂ ඤාණයෙන් අවබෝධ කරගත යුතු දේ විශේෂ ඤාණයෙන් අවබෝධ කරගන්නවා. පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැන ගන්නවා. ඒ විදියට අවබෝධ කරගත යුතු දේ අවබෝධ කරගන්නා, පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැනගන්නා ඒ භික්ෂුව මේ ජීවිතයේ දී ම දුක කෙළවර කරන්නෙක් වෙනවා."

05. මේ විදියට කියපුවාම, තවත් ස්වාමීන් වහන්සේ නමක් ථේර ස්වාමීන් වහන්සේලාට මෙහෙම කිව්වා.

"ඇවැත්නි, අධ්‍යාත්මික ආයතන හය එක් අන්තයක්. බාහිර ආයතන හය දෙවැනි අන්තය යි. විඤ්ඤාණය මැද යි. තණ්හාව තමයි මැහුම. ඒ ඒ භවයේ උපත ලැබීම පිණිස තණ්හාව සත්වයා ව ගෙත්තම් කරනවා (මසනවා).

ඇවැත්නි, මෙපමණකින් භික්ෂුව විශේෂ ඤාණයෙන් අවබෝධ කරගත යුතු දේ විශේෂ ඤාණයෙන් අවබෝධ කරගන්නවා. පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැන ගන්නවා. ඒ විදියට අවබෝධ කරගත යුතු දේ අවබෝධ කරගන්නා, පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැනගන්නා ඒ භික්ෂුව මේ ජීවිතයේ දී ම දුක කෙළවර කරන්නෙක් වෙනවා."

06. මේ විදියට කියපුවාම, තවත් ස්වාමීන් වහන්සේ නමක් ථේර ස්වාමීන් වහන්සේලාට මෙහෙම කිව්වා.

"ඇවැත්නි, සක්කාය (පඤ්චඋපාදානස්කන්ධය) එක් අන්තයක්. පඤ්චඋපාදානස්කන්ධයේ හටගැනීම (සක්කාය සමුදය) දෙවැනි අන්තය යි. පඤ්චඋපාදානස්කන්ධයේ නිරෝධය (සක්කාය නිරෝධය) මැද යි. තණ්හාව තමයි මැහුම. ඒ ඒ භවයේ උපත ලැබීම පිණිස තණ්හාව සත්වයා ව ගෙත්තම් කරනවා (මසනවා).

ඇවැත්නි, මෙපමණකින් භික්ෂුව විශේෂ ඤාණයෙන් අවබෝධ කරගත යුතු දේ විශේෂ ඤාණයෙන් අවබෝධ කරගන්නවා. පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැන ගන්නවා. ඒ විදියට අවබෝධ කරගත යුතු දේ අවබෝධ කරගන්නා, පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැනගන්නා ඒ භික්ෂුව මේ ජීවිතයේ දී ම දුක කෙළවර කරන්නෙක් වෙනවා."

මේ විදියට කියපුවා ම, තවත් ස්වාමීන් වහන්සේ නමක් ථේර ස්වාමීන් වහන්සේලාට මෙහෙම කිව්වා.

"ඇවැත්නි, අපි හැම දෙනා විසින් ම අපිට වැටහෙන දේ ප්‍රකාශ කරන්නට යෙදුනා. ඇවැත්නි, දැන් අපි යමු. භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ යම් තැනක ද එතැනට යමු. භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් මෙම කරුණ ප්‍රකාශ කරමු. භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ යම් ආකාරයකට ද, ඒ ආකාරයට එය මතකතබාගනිමු.

"එහෙම යි ඇවැත්නි" කියා ථේර ස්වාමීන් වහන්සේලා ඒ ස්වාමීන් වහන්සේට පිළිතුරු දුන්නා.

ඉන්පසු ථේර ස්වාමීන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට වැඩම කළා. වැඩම කොට භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පසෙකින් හිඳ ගත්තා. එකත්පසෙකින් හිඳ ගත් ථේර ස්වාමීන් වහන්සේලා තමන් සිදු කළ ධර්ම සාකාච්ඡාවේ සියලු ම දෑ භාග්‍යවතුන් වහන්සේට සැළකළා. මෙහෙම ත් විමසා සිටියාඃ

"ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, අපි ප්‍රකාශ කළ දේ අතරින්, කවුරු විසින් ප්‍රකාශ කළ දේ ද සුභාෂිතයක් වන්නේ?"

"පින්වත් මහණෙනි, ඒ ඒ කාරණයෙන් (පරියායෙන්) ඔබලා සියලු දෙනා විසින් ම කියූ දෑ සුභාෂිතයන් වෙනවා. එනමුත් මා විසින් පාරායන වර්ගයේ මෙත්තෙය්‍ය ප්‍රශ්නයේ දී යම් අර්ථයක් පිණිස මේ විදියට දේශනා කළා නම්, එනම්ඃ

**සෝ උභන්තමභිඤ්ඤාය[1] - මජ්ඣේ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහාපුරිසෝති - සො'ධ සිබ්බනිමච්චගා**

ඔහු විශිෂ්ට ඥානයෙන් අන්ත දෙක දැනගෙන ප්‍රඥාවෙන් මැද නො ඇලෙයි. ඔහු මහා පුරුෂයා යැ යි කියමි. ඔහු මැහුම (ගෙත්තම) ඉක්මවා ගියේ ය."

එසේ ප්‍රකාශ කළේ මෙන්න මේ අර්ථයෙනු යිඃ

"පින්වත් මහණෙනි, ස්පර්ශය එක් අන්තයක්. ස්පර්ශයේ හට ගැනීම දෙවැනි අන්තය යි.

ස්පර්ශ නිරෝධය මැද යි. තණ්හාව තමයි මැහුම. ඒ ඒ භවයේ උපත ලැබීම පිණිස, තණ්හාව සත්වයා ව ගෙත්තම් කරයි (මසයි).

පින්වත් මහණෙනි, මෙපමණකින් භික්ෂුව විශේෂ ඥාණයෙන් අවබෝධ කරගත යුතු දේ විශේෂ ඥාණයෙන් අවබෝධ කරගනියි. පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැන ගනියි. ඒ අයුරින් අවබෝධ කරගත යුතු දේ අවබෝධ කරගන්නා, පිරිසිඳ දැන ගත යුතු දේ පිරිසිඳ දැනගන්නා භික්ෂුව මේ ජීවිතයේ දී ම දුක කෙළවර කරන්නෙක් වෙනවා.”

භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ මේ උතුම් දේශනය වදාළා. ඒ පින්වත් ථේර ස්වාමීන් වහන්සේලා ඉතා සතුටට පත් වුනා. භාග්‍යවතුන් වහන්සේ වදාළ මේ උතුම් දේශනය සාධුකාර නංවමින් ඉතා සතුටින් පිළිගත්තා.

**සාදු ! සාදු !! සාදු !!!**

පසු සටහන

1. මෙම ගාථාව අංගුත්තර නිකායේ සඳහන් වන්නේ ‘සෝ උභන්තේ විදිත්වාන’ යනුවෙන් වන අතර සුත්ත නිපාතයේ සඳහන් වන්නේ ‘සෝ උභන්තමභිඤ්ඤාය’ යනුවෙනි. මෙහි අර්ථ වශයෙන් විශාල වෙනසක් නො මැත.



**DhammaMedicine**

Namo Buddhaya !!!
This is the only path;
there is none other for
the purification of insight !

Visit Our WebSite
Click2Comment | Discussions |



**Drink Dhamma medicine to get rid of all stresses**